# ලෙවන්ගම ගලපල්ලහේන විෂ වෙද පරපුරෙහි ප්‍රතිකාර ක්‍රමවල දක්නට ලැබෙන විශේෂතා

පාරම්පරික වෛද්‍ය සුනිල් චන්ද්‍රසිරි

ඒබ්‍රහම් සිංඤෝ, ඇල්පි සිංඤෝ, කේ.ජී. සේදිරිස් සිංඤෝ, කේ.ජී. ආරියතිලක යන පාරම්පරික වෛද්‍යවරුන්ගෙන් උරුම වූ ලෙවන්ගම ගලපල්ලහේන විෂ වෙදකම අද වන විට පාරම්පරික වෛද්‍ය කේ.ජී. සුනිල් චන්ද්‍රසිරි මහතා විසින් අඛණ්ඩ ව රැකගෙන යනු ලබයි.

**ප්‍රතිකාර ක්‍රමයෙහි විශේෂතා**

- දූත ලක්ෂණ මඟින් විෂ තත්ත්වය හඳුනා ගැනීම.
- විෂ කලාව, අමෘත කලාව නිර්ණය කර ප්‍රතිකාර සිදුකිරීම.
- මතුවන රෝග ලක්ෂණ අනුව ප්‍රතිකාර සිදු කිරීම.
- සර්පයා දැකීම අවශ්‍ය නොවන අතර රෝගියා දැකීමටත් පෙර දෂ්ට කළ සර්පයා හඳුනා ගැනීමට හැකි වීම.
- ප්‍රතිකාරයේ දී මුදල් බලාපොරොත්තු ව ප්‍රතිකාර සිදු නොකරන අතර කිසි විටෙක රෝගියා සමග මුදල් සම්බන්ධ ව කතා නොකිරීම.
- වෛද්‍යවරයෙකු ලෙස නොව රෝගියාගේ කරුණාබර මිත්‍රයෙකු ලෙසට රෝගියාට සමීප ව කටයුතු කිරීම.
- රෝගියාට මුල සිට ම ඇල් ජලය භාවිත කිරිමට දීම.

**ප්‍රතිකාර සිදුකරන අනුපිළිවෙළ**

මුලින් ම දූත ලක්ෂණ අනුව රෝග තත්ත්වය නිර්ණය කිරීම, සර්පයා හඳුනා ගැනිම, රෝගියාගේ ගැහැණු පිරිමි බව හඳුනා ගැනීම, වැදුණු දළ ගණන නිර්ණය කිරීම, රෝගියාගේ සාධ්‍ය අසාධ්‍යතාව නිර්ණය කිරීම සහ රෝගියා ජීවතුන් අතර සිටී ද නැද්ද හඳුනා ගැනීම.

| | |
|---|---|
| දූත පැවසූ තෙපුලේ අල් අකුරු | හැර |
| සුලඟිලි පටන් ගැන ගැන පිළිවෙළින් | වර |
| සුළඟිල්ලේ හුකු පොළගෙහි කිසන් | පෙර |
| වෙදඟිල්ලේ හුනු නාගයෙකි කියන් | හැර |

මැදඟිල්ලේ නම් - කරවැලෙකි, දබරඟිල්ල නම් - මාපිලෙකි, මහපටඟිල්ල නම් විෂ නැති සතෙකි. වචනයේ අකුරු ගැනීමේ දී හල් අකුරු ගණනයට නොගන්නා අතර, ඇඟිල්ලක පුරුක අනුව ගැහැණු පිරිමි බව නිර්ණය කළ හැක. දූතයාගෙන් පිට වූ වචනයේ අකුරු පිළිවෙළින් ඇඟිලි පුරුක් 2කට මැන බැලීමේ දී කෙළවර අකුර පළමු පුරුකට හිමි නම් රෝගියා පිරිමියෙකි. කෙළවර අකුර දෙවන පුරුකේ සිටී නම් රෝගියා ගැහැනියකි.

**දූතයාගේ අංග ලක්ෂණ**

- හිස අතගාමින් පැමිණි කාරණය කිවහොත් දෂ්ඨ කර ඇත්තේ මාපිලෙකි.
- කර අත ගා කිවහොත් කරවැලෙකි
- වැලමිට ඉදිරියට පා කිවහොත් තෙලිස්සෙකි.

- රවාගෙන කීවහොත් නාගයෙකි
- අත් ඉදිරියට ගෙන කීවොත් පොලගෙකි.
- පොළව හාරා කීවේ නම් අසාධ්‍ය ය.

**2. දෂ්ට කරන ලද දිනය අනුව වැදුණු දළ ගණන නිර්ණය කිරිම**

- ඉරිදා හිමි අන්තයා දෙදළහමාරකින කයා - දළ 2 ½
- සඳුදා උගෙ දවස් හිමි දෙදළපුරා කම් - දළ 2
- අඟහරුවාදා තුටයා තුන් දළකින් දකුණතයා - දළ 3
- බදාදාට සංඛපාල දෙදළ හමාරකින් ලීල - දළ 2 ½
- බ්‍රහස්පති මහා පත්ම දළතුනකින් මේස දෂ්ට - දළ 3
- සිකුරට හිමි දවසුත් දළ හතරකි දකුණු කන්ධ - දළ 4
- සෙනසුරු මහ ගුලිකයාට එක හමාර දළකි උඩට - දළ 1 ½

දේශීය වෛද්‍ය ක්‍රමයේ දී සර්පයාට දළ 4ක් පිහිටන බව සඳහන් වන අතර ඒවා තකරී, මකරී, යම්, යමදූති යන යක්ෂණියන්ගේ නම්වලින් හඳුන්වා ඇත.

**ප්‍රතිකාර විධි**

ඉහත සඳහන් ක්‍රම මගින්, රෝගියා හමුවීමට පෙර රෝගියා පිළිබඳ විස්තරාත්මක තොරතුරු වෛද්‍ය වරයාට දැන ගැනීමට හැකි වේ. රෝගියා හමු වූ විට රෝගියාට මෛත්‍රිය හා කරුණාව දැක්වීමටත්, රෝගියාගේ බිය සැක දුරු කිරිමටත්, රෝගියා සමග කුළුපග ව මිත්‍රයෙකු ලෙස කටයුතු කිරිමටත් වෛද්‍යවරයා අමතක නොකළ යුතුය. නිසැකව ම රෝගය සුවවන බවට රෝගියා තුළ විශ්වාසය ඇති කළ යුතුය.

**විෂ ඇද්දවීම**

මුලින් ම උණු වතුරෙන් හෝ දෙහි ලෙල්ලක් අතුල්ලා හෝ දෂ්ට ස්ථානය සෝදනු ලැබේ. පැඟිරි කටුවකින් හෝ පිරිසිදු ලෝහ කටුවකින් තුවාලය ලේ එන තුරු පාදා විෂ ඇද්දවීමට බෙහෙත් තබනු ලැබේ. (දෂ්ට කළ විට දෂ්ට ස්ථානය දැඩි වේ. ඉතා තද වේ)

**ලශුනාදිය ආලේප කිරීම**

මේ නමින් යුක්ත බෙහෙත් ගුලිය දෙහි ඇඹුලින් දිය කර මුඛයේ තබා වෛද්‍ය වරයාගේ අවබෝධය අනුව විෂ ශරීර ගත වී ඇති ප්‍රමාණය නිර්ණය කර ඉහත කියන ලද බෙහෙත දෙහි ඇඹුලින් දිය කර ශරීරය ඉහළ සිට පහළට ගෑම කළ යුතුය. විෂ ශරීර ගත වූ වේලාව හා අක්‍රාන්ත කොටස, ශරීර ගත විෂ ප්‍රමාණය අනුව ආලේප කළ යුතු ප්‍රදේශය නිර්ණය කරයි.

**ලශුනාදිය සකසා ගැනිම**

සුදු වරා මුල්, ඔළිද මුල්, පිළ මුල්, සුවද කොට්ටං, සුදු ළූණු එක පමණට ගෙන කොටා කුඩු කර රෙද්දෙන් හලා ඔළිද කොළ ඉස්මෙන් අඹරා ගුලි කොට පවනේ වියළා සුලං නොවදින පරිදි ආරක්‍ෂක බඳුනක තබා ගත යුතුය.

**පසුව විෂ බෑම සිදු කරනු ලැබේ**

දෙහි අත්තෙන් විෂ බෑම සිදු කරයි. හිසේ සිට පහළට විෂ බාන මන්ත්‍රය ජප කරමින් දෙහි අත්තෙන් මතුරනු ලැබේ.

"ඕං නමෝ තකරිය මකරිය යම් යම දූතීය

මැද්දට බ්‍රෝදිය මැලි යකින්නිය ඔහු දූන් මට ගේ හැර යක්"

"ඕං සෝරාටි හක් ඒ සයුරේ පුන : ආරෝ පුලි පුලි පොජ"

විෂ බැස්සවීමෙන් පසු තත්වය පරීක්ෂා කර බලා ඔළුවට සුදුසු තෙලක් දමා රෝගියාගේ වේදනාව අඩුවීමට හා විෂ බැස්සවීමට තැවිල්ලක් භාවිත කළ යුතුය.

**තැවිල්ලක්**

සියඹලා කොළ - වෙනිවැල් ගැට

එරබඳු කොළ - වරා කොළ

අමු කහ

මේවා එක පමණ ගෙන කොටා පොට්ටනි බැද එය නර මූත්‍ර හාල්පානු දිය යන දෙවගය දමූ මුට්ටියක කඩ පිම්මේ තම්බා එළගිතෙල් ගා උඩ සිට පහළට තැවීම. මෙයින් රෝගියාගේ ඉදිමුම් හා විෂ ද පහව යයි.

**වේදුවක්**

| | | |
|---|---|---|
| වරා කොළ | - වරා පොතු | - වරා මුල් |
| වරා මල් | - කොහොඹ කොළ | - මුරුංගා පොතු |
| දෙහි කොළ | - ඇඹුල් දොඩම් කොළ | - වැල් රුක් අත්තන කොළ |

මදුරුතලා

මේවා මුට්ටියකට දමා හොඳින් වසා තම්බා දුම් ඇල්ලීම

**මැල්ලුමක්**

සුළු විෂ නම් මැල්ලුමක් බැඳිය හැකිය.

දෙහි කොළ පොතු - අමු කහ ලුණු දමා කොටා මලවා බැදීම. විෂ ද ඉදිමුම ද පහව යයි. මෙය උදේ සවස මාරු කළ යුතුය.

උග්‍ර විෂ නම් - නස්‍ය පාන කළ යුතුය.

ගෙට යන රතු ලඳේ පොඩ්ඩක් නවතින්න -

පිටපොට යට ගැවේ මට පොඩ්ඩක් දෙන්න

අටවක දාට පිපෙන මල අර ගන්න -

මගෙ බුදු බැනො පතිදුගෙ විෂයට දෙන්න

රතු එැණු, අට්ටික්කා මල් තණකිරෙන් අඹරා හෝ යුෂයට තණකිරි මිශ්‍රකර නාග විෂට නස්න කළ යුතුය.

වංගමාලු කොයි දේසේ - ගත් කැළණිය ගං දේසේ

නස්න කළහොත් නාසේ - පොළොන් විෂ යයි දෙසේ

පුස්වැල් යුෂ, කැළණිය යුෂ සමග මිශ්‍රකර නස්න කිරිම

**සිහි මුර්ජා වූ විට යළි සිහි කැඳවිම ට නස්නයක්**

වරාකිරි, දළුක් කිරි, බෝ කිරි, රුක් අත්තන කිරි,පොල් කිරි

උදළු තැටිල්ලේ පැසවා ගෙන නස්න කිරිමෙන් මොන ම විෂක් උවත් දුරු වී රෝගියාට සිහිය එයි. තව ද,

අතු අග බටු දළු - කරල්සැබෝ ගන්

රසදිය මිරිසුන් - සමකර අඹරන්

සල්ලි පමණට - රොටි සාදා ගන්

පවනේ වියලා - සූරුකිව තබමින්

මුර්ෂා වී සිටි විට හිස මුදුන කටුවකින් සූරා එම බෙහෙත් රොටි තබා වරා කොළ 7ක් තබා ගිනි කබලකින් එය රත්කිරීම ප්‍රමාණවත් වේ. පහළින් විෂ පිහිටියේ නම් එම බෙහෙත් රොටිය යටිපතු සූරා ඒ ආකාරයට ම කිරීමෙන් පහළට විෂ බැස විෂ ඉවත් වේ.

**සාමාන්‍ය විෂට නස්නයක්**

දෙහි දළු තන කිරෙන් අඹරා නස්න කරයි. සුදුසු අවස්ථාවේ සුදුසු නස්න කළ යුතුය.

**උග්‍ර විෂට කැඳ**

වඳගැනිගෙ කෙස් කොළ ගෙන - රෑට පැලට එන කල දූන

තන අල්ලා තෙල් ගනිමින - පොළොං විෂට කැඳපිස දෙන

වද කහ කොළ, මදුරු තලා කොටා මිරිකා කැද පිස නිවා ගත් පසු එළඟිතෙල් අසුපින දා රෝගියාට පෙවිය යුතුය. තවදුරටත් කරපිංචා කොළ කොටා යුෂ ගෙන හීනටි හාල් නැතහොත් හනසාල් නැතහොත් උළු හාල් මෙයින් එකක් සමග කැද පිස දී ම ඕනෑ ම විෂකට සුදුසුය.

**මාපිල් දෂ්ටයක දී**

සෙම කෝප වූ විට සෙම ඉවත් කිරීම සඳහා මූණමල් ඇට මද, කරපිංචා ගෙඩි, දෙහි ඇට දෙහි ඇඹුලින් අඹරා උගුර තුවාල නොවන සේ ගෑමෙන් සෙම විරේක වේ. මෙය බඩට දුන හොත් බඩ විරේක වේ.

**පොළොං දෂ්ටයක දී**

සුදු එැණු අරක්කුවෙන් අඹරා බඩට පැළැස්තර දැමීමෙන් බඩට ලේ බැසීමෙන් වලක්වා ගත හැකිය. ඉන් හෘදය ආරක්ෂා කර ගත හැක.

**කරවැල් දෂ්ටයක දී**

ඇස් පෙනීම අඩු වී නම් රත් මල් - හදුන් දෙවගය අඹරා ඇස වටා ගා ඇසේ කුරුම්බා ලොඳ තැබීමෙන් ඇස්වල විෂ දුරු වේ.

**විෂ ගුලිය පරීක්ෂා කිරීම**

වාන්නත ගුලිය - විෂ ඇද්දවීම සඳහා භාවිත කරණ මෙම ඔසු ගුලිය සාදා ගැනීමෙන් පසු එය පරීක්ෂා කිරීම සඳහා ක්‍රමයක් යොදා ගනී.

ඊට නාගයෙකු අල්ලා පතුරු අරින ලද කෙසෙල් ගසක කඳකට දෂ්ට කරවයි. රසදිය කඳ මෙන් රතු පාටට ඉහළ යන ඒ රේඛාව මුලට විෂ ගල තැබීමෙන් එය ක්ෂණික ව පහළට බැසීම සිදු වේ.

රෝගියාට සුව වූ පසුව අවසානයට විරේක කිරිම සිදු කරයි.

**විරේකය සඳහා**

ජාපාල යාමයක් වී ගොඩින් තම්බා විෂ හැර ගෙන ජාපාල බීජය දෙකට පලා මැද අංකුරය ඉවත් කර එළකිරෙන් සෙනු වේලා ගෙන කළුදුරු, නෙල්ලි යන මේවා ජාපල බර හා සමාන ව ගෙන කළුවන තුරු කබලේ බැද කුඩුකර රෙද්දකින් හලා රෝගියාගේ ශරීර ශක්තිය අනුව ඇල්වතුර ටිකකට දියකර දීමෙන් පසු විනාඩි 45කින් පමණ ඇල් වතුර වීදුරුවක් බීමට දීමෙන් පැයක් ඇතුළත විෂ විරේක වේ. අවශ්‍ය තරම් විෂ විරේක වූ විට විරේක නැවතීම සඳහා උදයේ දී අප තම්බා ගත් මුරුංගා කොළ වතුර බීමට දී මිරිස් හොදි සමග බත් දෙන අතර විරේක නැවත්වීම සඳහා උනු වතුර පෙවිය යුතුය. කෝපි දිය යුතුය. එයිනුත් නොනවතීනම් එරබදු කොළ කොටා උණු වතුර ස්වල්පයකින් ඉස්ම මිරිකා දීමෙන් සම්පූර්ණයෙන් නතර වේ. විෂ ශරීර ගත වී දින 2කට 3කට පසුව විෂ විරේකයට සුදුසු වේ.

සර්ප විෂ ප්‍රතිකාරයේ දී පළමු ව රෝගියා ගේ බිය තුරන් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. දෂ්ටනයට ළක් වූ විගස නිසි ප්‍රතිකාරයක් ලබා දෙන තුරු කරපිංචා කොළ ඉස්ම හෝ වෙනත් සුදුසු ඖෂධයක් ලබා දීම මගින් හෘදයට හා වෘක්කවලට විෂ ගමන් කිරීම වැළැක්විය යුතුය.

**විෂ මූර්ජා වී ඇති විට ප්‍රතිකාර**

විෂ ශරීරයේ ඉහළ කොටසක පවතී නම්, එළබටු දළු, කරල් සැබෝ දළු, ගම්මිරිස්, රසදිය සමග අඹරා කාසියක පමණ විෂ්කම්භය ඇති රොටි සාදා, හිස් මුදුන සුදුසු කටුවකින් සූරා, රොටිය එහි එළන්න. පසුව වරා කොළ 7ක් එළා ගිණි කබලක් ඒ මත තබා බෙහෙත් රත් වන විට ගිණි කබල ඉවත් කරන්න.

**නස්න**

පොළොන් විෂට - පුස්වැල් යුෂ, රුක් අත්තන කිරි, කැළණිය කිරි දෙවගය හෝ රුක් අත්තන කොළ පොතු, කැළණිය කොළ පොතු යනාදිය නස්න කරනු.

නාග විෂට - වරා කිරි, රුක් අත්තන කිරි, දලුක් කිරි, පොල් කිරි යන මේවා උදළු තැටිල්ලේ පැසවා නස්න කිරීම.

මුරුංගා පොතු, බටු කරවිල කොළ, දෙහි දළු, තඹල කොළ, සුදුළූණු මේ හැම අඹරා නස්න කිරීම. නස්න කිරීමෙන් අනතුරුව වේදු ඇල්ලීම කළ යුතුය. උදාහරණ ලෙස මුරුංගා පොතු, කොහොඹ කොළ, දෙහි කොළ, දොඩම් ඇඹුල් කොළ, වරා කොළ- පොතු- මුල්- මල්, මල් ගස්ලබු මුල්, මදුරුතලා තම්බා සර්වාංගයට ම දුම් ඇල්ලිය යුතු ය. විෂ ශරීරයේ පහළ කොටසක පවතී නම්, යටි පතුල ඉරා ඉහත කී බෙහෙත් රොටිය එහි එළන්න. හකු තද වී ඇති විට, දෙහි ඇඹුල් හා ඉඟුරු ඉස්ම දෙසවන වත් කරන්න. පසුව මූණා මල් පොතු, ලුණුවරණ පොතු කොටා පොට්ටනි බැඳ වණ්ඩුවේ තම්බා හකු ප්‍රදේශය තවන්න.

### දෂ්ට ස්ථානය සඳහා ප්‍රතිකාර

දෂ්ට මුඛය පිරිසිඳු කොට විෂ ඇදීම සඳහා සුදුසු බෙහෙත් ගුලි දෙහි ඇඹුලෙන් දිය කර දෂ්ට මුඛයට තැබිය යුතුය. ඒ සඳහා සුදුසු බෙහෙත් ගුලි නම් ලසුනාදිය, අර්කාදිය, රහස් බෙහෙත් ගුලි, රසදිය ගුලිය ආදිය යි, මේවා විෂ තිබෙන ආකාරය බලා දෂ්ට මුඛයට තැබිය යුතු ය. ලසුනාදිය ගුලිය යොදා ගන්නේ නම්, සුදු වරා මුල්, ඔළිඳ මුල්, පිළ මුල්, සුදුළූණු යනාදිය ඔළිඳ කොළ ඉස්මෙන් අඹරා ඇඟ ගැල්විය යුතු ය. එය කළ යුත්තේ දෙහි ඇඹුල් හෝ හාල්පාණු දිය සමගය.

අනතුරුව ඉදිමුම් හා විෂ බැසීමට මැල්ලුම් බැඳීම සුදුසුය. මෙහිදී සුළු සර්ප විෂට දෙහි කොළ, පොතු, අමුකහ, ලුණු දමා කොටා මලවා බැඳීම ද, උග්‍ර විෂට නම් බෝ කොළ පොතු, කළුහබරල අල, අමුකහ, ලුණු දමා කොටා මලවා බැඳීම ද කළ යුතුය. ඉදිමුම් නොබසී නම් තැවිල්ලකින් තවා මැල්ලුම් බැඳීම ඉතා සුදුසු ය. තැවිල්ලක් ලෙස වෙනිවැල්ගැට, එරබදු කොළ, සියඹලා කොළ, අමුකහ, වරා කොළ ගෙන කොටා පොට්ටනි බැඳ හාල්පානු දිය, දැරි නරමුත්‍රා දෙවර්ගයෙන් පොට්ටනි වණ්ඩුවේ තම්බා එළගිතෙල් ගා තැවීමෙන් වේදනා හා ඉදිමුම් බැසයයි. තවද ඒ ඒ විෂට අදාළ කෂාය වර්ග ද ලබා දිය යුතුය.

### හිස ගැල්ලුම් සහ ආලේප

ගොඩ මානෙල් අල, එරබදුපොතු, කළුවාල ගෙන කොටා මිරිකා එම යුෂ ඇඟ හිස ආලේප කිරීම. රෝගියාගේ ඇස්වල විෂ සිටියොත් බක් මී ඇට, ඔලිඳ ඇට, ගම්මිරිස් යන මේවා සම ව ගෙන අඹරා ඇස්වල වට ගෑමෙන් පසු ඇසට කුරුම්බා ලොඳ දැමීමෙන් විෂ ඇඳිරිය දුරුවේ.

### කැඳ වර්ග

කුමන ආකාරයේ විෂකට වුවත් කැඳ වර්ග දීම ඉතා සුදුසු ය. විෂ හේතු කොට ගෙන පපුවේ සෙම තද වූ විට මූණමල් ඇට, කරපිංචා ඇට, දෙහි ඇට යනාදිය දෙහි ඇඹුලෙන් අඹරා උගුරේ ගෑම සිදු කෙරේ. මෙය අභ්‍යන්තරව යෙදීමෙන් විරේචනය සිදු වේ. එය විෂ පහ කිරීම සඳහා භාවිත කළ හැක. පොළොන් විෂේ දී කැඳ වර්ග ලෙස මදුරුතලා කොළ, වදකහ කොළ ඉස්ම ගෙන කැඳ කර එළඟිතෙල් දමා දිය යුතුය. නාග විෂට නම් ඉරමුසු, දෙමට පොතු, කුඩුමිරිස්ස, දිවුල්මුල්, මුගුණුවැන්න, ඉඟුරුපියලි, දානහලා හාලෙන් කැඳ පිස දෙනු ලැබේ. දානහලා නොමැති නම් ඒ වෙනුවට උළුහාල් ගත හැක. සුළු සර්ප විෂට කරපිංචා කොළ කොටා යුෂ මිරිකා හීනටි හාලෙන් හෝ උළුහාලෙන් කැඳ පිස දිය යුතුය.